# රබර් මිළ පහත වැටීමට හේතු හා රට ප්‍රතිකර්ම

එල්.එම්.කේ. තිලකරත්න සහ නිහාල් සමරප්පුලි

1993ට පෙර පුරා දශකයක පමණ කාලයක සිට රබර් කිලෝවක් සඳහා රු.22 - 35 අතර වූ මිළක් ගෙවන ලද අතර මෙම වකවානුව තුළ අනර්ඝතම සුදු ක්‍රේප් සඳහා ද ගෙවන ලද්දේ රු.5/- කට නොවැඩි අමතර මිළකි. මෙම තත්ත්වය යටතේ ඉතා උදාසීනව හා අසරණව සිටි රබර් ගොවියාට යන්තම් හිස ඔසවා ගැනීමට ප්‍රධාන හේතුවක් වූයේ සෝවියට් සමුහාණ්ඩුවේ කඩා වැටීමත් සමඟ ඉන් මිදි ස්වාධීන රටවල් බවට පත්වූ යුක්රේනය, රුමේනියාව සහ බල්ගේරියාව වැනි රටවල් තම සිතූ මනාපය පරිදි අනර්ඝ වර්ගයේ භාණ්ඩ නිෂ්පාදනය පිණිස ස්වාභාවික රබර් භාවිතය ආරම්භ කිරීම හේතුවෙන් ලෝක වෙළඳපොලේ රබර් මිළ 1993 අවසාන කාර්තුවේ සිට වැඩිවීමට පටන් ගැනීම නිසාය. මෙම සීඝ්‍ර මිළ වැඩිවීම හේතුවෙන් 1995 පමණ වන විට ෂීට් රබර් සඳහා ගෙවන ලද මිළ රු.70/-ට පමණ වැඩිවූ අතර සුදු ක්‍රේප් රබර් වල මිළ ඒ වන විට රු.100 - ට ආසන්න විය.

සුදු ක්‍රේප් මිළ මෙතරම් හොඳ තත්වයක පැවතීමට හේතු වූ ප්‍රධානම කරුණ නම් අප ආයතනය ප්‍රමුඛව ලංකා ආණ්ඩුව මඟින් පසු ගිය වසර කිහිපය තුල ක්‍රේප් රබර් සෞඛ්‍යය හිතකර භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අනර්ඝතම හා පිරිසිදුම රබර් වර්ගය ලෙස ජාත්‍යන්තරව හඳුන්වා දීමට දරණ ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි. එහෙයින් රබර් සඳහා දැනට පවතින පහත් මිළ තත්ත්වයන් යටතේ වුවද අප රබර් කර්මාන්තය මෙතරම්වත් දරා සිටීමට හේතු වූයේ අප ක්‍රේප් රබර් නිෂ්පාදනය යි. අද ක්‍රේප් වලට ගෙවන මිළ ෂීට් රබර් මිළ මෙන් දෙගුණයකි. ඒ හෙයින් 25% පමණ ක්‍රේප් රබර් නිපදවන ශ්‍රී ලංකාවට අසල්වැසි ආසියාතික රටවල මුදල් බාල්දුව බලපා ඇත්තේ සාපේක්ෂව අඩු මට්ටමකිනි.

ඉහත තත්ත්වයට ඉවහල් වූ අන් කරුණ නම් අප ක්‍රේප් රබර් නැව් ගත කරන්නන් අලෙවි කරන දිනට මාස 6කට පමණ පෙරාතුව රබර් අලෙවි කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර තැබීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීමයි. උදාහරණයක් ලෙස ඔවුන් අද නිපදවුනු ක්‍රේප් සඳහා මිළ නියම කොට ඇත්තේ මීට මාස ගණනාවකට පෙර පැවති මිළ ගනන් හා සමාන වන ආකාරයටමය. එබැවින් මේ වනතුරුත් ක්‍රේප් රබර් සඳහා කිලෝවකට රු.75/- ක් ද සෝල් ක්‍රේප් සඳහා කිලෝවකට රු.130/-ක් ද පමණ අපට ලැබේ.

මුදල් බාල්දු වීම හේතුවෙන් තම රටවල් තුළ රබර් මිළ සීඝ්‍රයෙන් ඉහළ යෑම හේතු කොට ගෙන ලෝකයේ රබර් නිෂ්පාදනය කරන බොහෝ රටවල් තම රබර් නිෂ්පාදනය සීඝ්‍රයෙන් වැඩිකර විදේශ විනිමය වැඩි පුර උපයා ගැනීමට පෙළඹුණාහ. උදාහරණයක් ලෙස 1994 පටන් තම රබර් නිෂ්පාදනය වසරකට 9%ක පමණ ප්‍රමාණයකින් අඩු කිරමට සැලසුම් කර සිටි මලයාසියාව එය 24% ක වර්ධනයක් බවට පරිවර්තනය කරන ලදී.

ලංකාවේ රබර් ගොවීන්ද රබර් සඳහා ඉහළ මිළක් පැවති කාලය තුල මෙම වැඩි මිලෙන් උපරිම වාසි ගැනීම අරමුණු කරගෙන වැඩිපුර අස්වැන්නක් ලබා ගැනීම සඳහා රබර් වලට පොහොර යෙදීමට යුහුසුළු වූ අතර. එවකට ප්‍රධාන ප්‍රශ්ණයක් ව තිබූ කිරි කැපුම්කරුවන්ගේ හිඟය මඟහරවා ගැනිම පිණිස වැඩි වැඩියෙන් ගම්මුන් පොළඹවා ගැනිමට කිරි කපන්නන්ගේ දෛනික කුලිය 40% - 60% පමන දක්වා වැඩි කරන ලදී. රබර් මිළ වැඩිවීම සමඟම ඒ සඳහා භාවිතා කරනු ලබන රසායන ද්‍රව්‍යය මිළ ඉහළ යාමද නිරන්තරයෙන්ම සිදු විය. ඒ හෙයින් ෂීට් රබර් හා ක්‍රේප් රබර් වල නිෂ්පාදන වියදම් පසු ගිය වසර දෙක තුළ සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇත.

### මිළ පහත වැටීමට හේතු

1997 පෙරවාර් මස පටන් සියළු වර්ගවල රබර් මිළ සීඝ්‍රයෙන් පහත වැටීමට පටන් ගැනින මීට ප්‍රධාන හේතුව ලෙස පෙන්වා දී ඇත්තේ අග්නිදිග ආසියාතික රටවල. විශේෂයෙන්ම අද ලෝකයේ ප්‍රධානම රබර් නිෂ්පාදනය කරන රටවල මුදලේ අගය පහත වැටීමයි. උදාහරණයක් ලෙස තායිලන්ත මුදල වන තායි බාට් එකක අගය 40% බාල්දු වීමෙන් එරට රබර් නිෂ්පාදකයාට තම නිෂ්පාදන සඳහා ගෙවනු ලබන මිළ 40% කින් පමණ ඉහළ ගියේය. මේ හේතුකොට තායි රබර් ගොවීන් තම අත ඇති සියළු රබර් තොග හැකි ඉක්මනට විකුණා ගැනීමට පෙළඹුන අතර මේ හේතුවෙන් ලෝක වෙළඳ පොලෙහි රබර් අති විශාල ප්‍රමාණයක් මේ කෙටි වකවානුව තුල අලෙවි වී ඇත. මෙයින් තායිලන්ත ආර්ථිකයට සිදු වූ විදේශ විනිම පාඩුව අති විශාලය.

තවද, මෙම කාල පරිච්ඡේදය තුල තායිලන්තය තම සුළු රබර් වතු හිමියනට ගෙවන අවම සහතික මිළ සෑහෙන කලක් ඉතා ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමද මෙම තත්ත්වය ඇති වීමට හේතු වූ බව ආර්ථික විද්‍යාඥ මතයයි. ඇමරිකාවේ හා යුරෝපයේ රබර් භාණ්ඩ

නිෂ්පාදකයන් පසු ගිය වසර තුළ පරිභෝජනය කරන ලද රබර් ප්‍රමාණය ඉතා පහත තත්ත්වයක පැවැති වද මෙම මිළ පහත වැටීමට තවත් ප්‍රධාන හේතුවකි

අද ලොව රබර් භාණ්ඩ නිෂ්පාදකයන් මෙසේ අඩු මිලට ගත් රබර් විශාල වශයෙන් ගබඩා කර ගෙන තොග පවත්වා ගෙන යන බැවින් එම නිෂ්පාදකයින් වෙළඳ පොලෙන් රබර් මිලදී ගැනීමට ඉදිරිපත් නොවීමද මෙම කණගාටුදායක රබර් මිල තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යාමට හේතු සාධකයක් ව ඇත

**ප්‍රතිවිපාක**

අද ග්‍රාමීය වෙළඳ පොලේ ෂීට් රබර් සඳහා ගෙවන මිළ රු 32 - පමණ දක්වා පහත වැටී ඇති අතර නිදහස් වෙළඳ කලාපයේ සමහර ආයෝජකයන් තම ව්‍යාපෘති සඳහා අඩු මිලට රබර් ආනයනය කිරීමට ද පෙළඹී ඇත

මෙලෙස ආනයනය කරන ෂීට් රබර් කිලෝවක් සඳහා ගෙවන මිල ලංකාවේ සාමාන්‍ය රබර් මිලට වඩා රු 5-6 පමණ අඩුය අද තායිලන්තයෙන් ගෙන්වනු ලබන වියළි උකු කිරි කිලෝවක් සඳහා වැය වනුයේ ලංකාවේ උකු කිරි කිලෝවක නිෂ්පාදන මිලට වඩා රු 15-18 අතර වූ අඩු මිලකි. ඒ හෙයින් අද ලංකාවේ ඇති සමහර ප්‍රධාන ආයෝජකයින් පවා උකු කිරි තායිලන්තයෙන් ගෙන්වා නිමි භාණ්ඩ නිපැයුමට පෙළඹී ඇත

ශ්‍රී ලංකාවේ බොහෝ පෙදෙස් වල වෙසෙනා සුළු රබර් වතු හිමියන් තම කිරි. ඉඩම ආසන්නයේ ඇති කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයන් හරහා කේන්ද්‍රාපසාරී උකු කිරි කම්හල වෙත විකුණනු ලැබේ. මෙයින් ඔවුනට ෂීට් රබර් නො ! ට වඩා වැඩි මිලක් නිරතුරුවම ලැබුණ බොහෝ වතු හිමියන් පසුගිය වසර කීපය තුළ කරන ලද්දේ තම රබර් කිරි. උකු කිරි කම්හල් වෙත ලබා දී ඉන් උපරිම මිලක් ලබා ගැනීමයි මේ හේතුවෙන් අද බොහෝ සුළු වතු හිමියන් සතුව කිරි මිදවීමට. ඇඹිරීමට හා දුම් ගැස්සවීමට අවශ්‍ය උපකරණ හා පහසුකම් නොමැත කරුණු මෙසේ තිබියදී නිමි භාණ්ඩ කර්මාන්තකරුවන් පිටරට ලාභ උකු කිරි ආනයනය කිරීමට පෙළඹීම හේතුවෙන් සුළු හිමියගේ කිරි මිලදී ගැනීම අඩු කළහ. මේ මගින් මෑතකදී බොහෝ සුළු වතු හිමියන් ඉතාම අසීරු තත්ත්වයකට පත්වුනි බොහෝ ගොවීන්ට වෙන කර කියා ගත හැකි ක්‍රමයක් නොවූ හෙයින් තම ඉඩම් වල කිරි කැපීම ද අත්හිටුවන ලදී

මේ අවස්ථාවේදී මතක් කළයුතු අනෙක් වැදගත්ම කරුණ නම් සුළු වතු හිමියන් මෙසේ උදාසීන වීම හේතුවෙන් ලංකාවේ රබර් නිෂ්පාදනය පහත වැටුන හොත් දීර්ඝ කාලීනව සළකා බැලීමේදී එයින් අවාසි සිදුවන්නේ රබර් නිම් භාණ්ඩ නිෂ්පාදකයාටය රබර් නිෂ්පාදනය මේ ආකාරයෙන් අඩුවී ගියහොත් ලංකාවටද ඉන්දියාවට මෙන් නිම් භාණ්ඩ නිෂ්පාදනය උදෙසා රබර් පිට රටින් ගෙන් වීමට අවශ්‍ය වන දිනය වැඩි ඈතක නොවෙනු ඇත එබැවින් රබර් සුළු වතු හිමියාගේ අවශ්‍යතා සොයා බැලීම හා ඔවුන්ගේ වගා පවත්වා ගෙන යාමට උපකාර කිරීම නිම් භාණ්ඩ නිපදවනු ලබන කර්මාන්තකරුවාගේ යුතුකමක් වනු ඇත.

ලෝකයේ ප්‍රධාන පෙළේ රබර් නිපදවන රටවල තම මුදල් බාල්දු කිරීම හේතුවෙන් එරට ආර්ථිකයන්ට විශාල පහරක් වැදී ඇත එමඟින් වැඩිම පීඩාවට පත්ව ඇත්තේ තායිලන්තය සහ ඉන්දුනීසියාවයි. තවද, මෙම රටවල් තුළ බල පවත්වන මෙම අනපේක්ෂිත මිළ වැඩිවීම හේතුවෙන් එරට වල සුළු වතු හිමියන්ගේ සහ රාජ්‍ය වතුයාය වලත් රබර් නිෂ්පාදනය උපරිමයෙන් සිදු කරමින් ලෝක වෙළඳ පොලට තව තවත් රබර් එවනු ලැබේ. මෙයින් මුදල් බාල්දු නොකළ ශ්‍රී ලංකාව වැනි රටවලට මුහුණ පෑමට සිදුව ඇත්තේ බලාපොරොත්තු නොවූ විරූ තර්ජනයකි.

## අනාගත මිළ මට්ටම්

රබර් වල අද පවත්නා පහත් මිළ මට්ටම තව කොපමණ කලක් පවතීද යන්න අවිනිශ්චිතය. සමහර ජාත්‍යන්තර ආයතන එය මාස කීපයකින් යථා තත්ත්වයට පත් වේ යැයි අනාවැකි පළ කලද වෙනත් ජාත්‍යන්තර සංවිධාන සඳහන් කරන්නේ එවැනි වෙනසක් නුදුරු අනාගතයේදි සිදු නොවන බවයි. තවද, මීට පෙර ජාත්‍යන්තර සංවිධාන මඟින් පෙන්වා දුන්නේ වර්ෂ 2000 වන විට ලෝකයේ රබර් හිඟයක් ඇති වන බවයි. ඒ හේතුවෙන් බොහෝ රබර් නිෂ්පාදනය කරන රටවල් රබර් අලෙවියෙන් හොඳ මිලක් ලබා ගැනීම සඳහා පසුගිය වසර කීපය තුළ රබර් නිෂ්පාදනය සීඝ්‍රයෙන් වර්ධනය කර ඇති බැවින් හා යුරෝපයේ රබර් පරිභරණය පහත වැටීම හේතු කොට ගෙන වර්ෂ 2000 වන විට ලෝක වෙළඳ පොළේ රබර් අතිරික්තයක් ඇතිවේ යැයි ද මත පළවී ඇත. එසේ වුවහොත් තත්ත්වය තවත් නරක අතට හැරීමට ඇති අවකාශ ඉතා වැඩිය. මේ හේතුවෙන් ස්වාභාවික රබර් නිපදවන්නන්ගේ සංගමය තම සාමාජික රටවලට හැකි පමණ නිෂ්පාදනය අවම කරන ලෙස ඉල්ලා ඇත. එසේ නොකල

හොත් රබර් මිළ ගනන් වල වර්ධනයක් අනාගතයේදී වුවද බලාපොරොත්තු විය නොහැකි බව එම සංවිධානයේ මතයයි

**ප්‍රතිකර්ම**

මින් ඉදිරියට උකු කිරි ආනයනයට අවකාශ නොදීමට මහ කොළඹ ආර්ථිකයත් වෙළඳ අමාත්‍යාංශයත් තීරණය කර ඇති හෙයින් එමගින් ශ්‍රී ලංකාවේ සුළු රබර් වතු හිමියාට සිදු විය හැකිව තිබු පාඩුව මගහැර ඇත යම් හෙයකින් පිටරටින් මෙම ලාභ උකු කිරි ගෙන්වීමේ ක්‍රියාවලිය පවත්වා ගෙන ගියේ නම් එයින් ක්ෂේත්‍රයේ විසිර ඇති ලක්ෂ සංඛ්‍යාත සුළු රබර් වතු හිමියන්ට සිදු වන්නට තිබුනා වු අයහපත් ප්‍රතිවිපාක ඉතා විශාලය

මෙයින් සුළු වතු හිමියාට සිදුවිය හැකිව තිබු පාඩුවට අමතරව රටේ ආර්ථිකයට ද මහත් බලපෑමක් වීමට ඉඩ තිබුණි ඒ හෙයින් ලංකා ආණ්ඩුව හා මහ කොළඹ ආර්ථිකය මගින් උකු කිරි ආනයනයට පන වන ලද තහංචිය ප්‍රසංශාභිමුඛයෙන් මතක් කළ යුතු වේ

පහත වැටී ඇති රබර් මිළ ඉහළ නංවා ගැනීම පිණිස කළ හැකි තවත් විකල්පයක් නම් අප රටේ රුපියලද බාල්දු කිර්මයි එහෙත් එමගින් සාමාන්‍ය ජනතාවට ඉදිරියේදී ඉසිලිය නොහැකි ජිවන බරක් පැටවෙනු නියතය

මෙම මුදල් බාල්දු කිර්ම හේතු කොට ගෙන පීඩාවට පත් නොවු රබර් නිපද වන රටවල් දෙක ලෙස ඉන්දියාව සහ චීනය නම් කල හැක මෙම රටවල් දෙක වසරකට පිළිවෙලින් රබර් මෙට්‍රික් ටොන් 500000 හා 300000 පමණ නිපදවන මුත් ඒ සියලල නිමි භාණ්ඩ නිපැයුම සඳහා රට තුළම පරිභෝජනයට යොදා ගැනේ තවද අවශ්‍ය කරන මදි පාඩුව ආනයනය කරති එබැවින් ඔවුනට මෙම විනිමය බාල්දුව මගින් කිසිදු හානියක් සිදුවී නැත

එසේ නම් අප ශ්‍රී ලංකාවේද කළ යුත්තේ තම නිමි භාණ්ඩ කර්මාන්ත වැඩි වැඩියෙන් ආරම්භ කර මෙරට නිපදවන රබර් සියලලම නිමි භාණ්ඩ බවට පත්කර අපනයනය කිර්මයි එසේ කළහොත් අප ආර්ථිකයට එමගින් විශාල විදේශ විනිමයක් උපයා ගැනීමට සැලසෙනවා පමණක් නොව එමගින් ශ්‍රී ලංකාවේ රැකී රක්ෂා ප්‍රශ්ණයද බොහෝ දුරට විසඳෙනු ඇත තවද බාහිර බලපෑමකින් තොරව සුළු වතු හිමියාට නිවහල්ව ජිවත් විය හැකි උසස් මට්ටමකට රබර් මිළ පවත්වා ගෙන යාමටද එය ඉවහල් වනු ඇත